# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම - 2025
# සිංහල භාෂාව හා සාහිත්‍යය

නම / විභාග අංකය : ..........................................................................................................................

| 08 ශ්‍රේණිය | I සහ II පත්‍රය | කාලය : පැය දෙක යි. |
|---|---|---|

- **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම කොටස සඳහා **ලකුණු 40ක්** ලැබේ.
- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) වරණවලින් **නිවැරදි** උත්තරය තෝරා යටින් ඉරක් අඳින්න.

- **එක් එක් වාක්‍යයෙහි ඉරි ඇඳි කොටසේ අදහස ප්‍රකාශ වන පිළිතුර තෝරන්න.**

**(01)** ආරංචිය ඇසූ සියාතුහාමිට **<u>හීන් දාඩිය දැම්මේ ය.</u>**

(1) ශරීරයෙන් ඩහදිය වැගිරුණේ ය. (2) මහත් පුදුමයට පත් විය.
(3) දැඩි වෙහෙසක් ඇති විය. (4) හදිසි භීතියකට පත් වුණේ ය.

**(02)** එම බෙහෙත **<u>සිකුරට ම හරි යන බව</u>** සැමගේ විශ්වාසය විය.

(1) කිසි ලෙසකින්වත් නො වරදින බව (2) සිකුරු ග්‍රහයා මෙන් වන බව
(3) සමහර විට සුවපත් වන බව (4) කෙසේ හෝ වරදින දෙයක් බව

- **අංක (03) සහ (04) ප්‍රශ්නවල දැක්වෙන වාක්‍යවල හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.**

**(03)** තාගෝර්ගේ නාට්‍ය මගින්, ඔහු තුළ තිබූ දැඩි ..................................... පෙන්නුම් කරයි.

(1) ප්‍රෞඪත්වය (2) උඩඟුකම (3) දේශමාමකත්වය (4) විශිෂ්ට බව

**(04)** අතීතයේ අස්වනු සරු කළ ..................................... ස්තුති කිරීමට උත්සව පවත්වා ඇත.

(1) නිර්මාණකරුවන්ට (2) බලවේගයන්ට (3) සුදුස්සන්ට (4) නිලධාරීන්ට

**(05)** සියලු ම පදවල අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පිළිතුර තෝරන්න.

(1) අභිරූපන, ගවේෂණය, නිදර්ශන, වර්ධනය (2) ආඝ්‍රාණය, සමස්ථ, පෘථිවිය, ප්‍රතිඵල
(3) කනිෂ්ඨ, කෘතිම, ධ්‍රැවය, කාර්යාලය (4) තීක්ෂ්ණ, පරිගණකය, ගිජ්ඣකූටය, ඛනිජ

**(06)** අකාරාදි පිළිවෙළට පද යෙදී ඇති පිළිතුර තෝරන්න.

(1) රුමේනියාව, රුසියාව, බෙල්ජියම, ඝානාව (2) තෙඹු, තෝර, තුත්තිරි, තැඹිලි
(3) ගන්දර, ගාල්ල, ගිංතොට, ගොඩගම (4) රාජසිංහ, දුටුගැමුණු, පරාක්‍රමබාහු, විජය

**(07)** මහාප්‍රාණ අක්ෂර සහිත පද පමණක් යෙදී ඇති පිළිතුර කුමක් ද ?

(1) ලේඛනය - සජ්ඣායනා (2) ශීඝ්‍රගාමී - චන්ද්‍රයා (3) තෘෂ්ණාව - ප්‍රධාන (4) ඥානය - එළුවා

**(08)** ඉදිරියෙන් ඇති පදයට ගැළපෙන සමානාර්ථ පද පමණක් යෙදී ඇති පිළිතුර තෝරන්න.

(1) සයුර = මුහුද, සිඳු, ජලනිධි, සිලිලාර (2) හිරු = දිනකර, තුසරකර, දිනමිණ, නුබමිණ
(3) ගෘහය = ගෙය, නිවස, ගෙදර, සරය (4) විහඟ = කොවුල්, සියොත්, සකුණ, පක්ෂී

**(09)** විරුද්ධාර්ථවත් පද යුගලය සහිත පිළිතුර තෝරන්න.

(1) අනිවාර්ය - වෛකල්පික (2) උපකාර - ප්‍රත්‍යුපකාර (3) ඉඩෝරය - නියඟය (4) විරල - දුලබ

**(10)** ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය සහිත පිළිතුර තෝරන්න.

(1) සිසුවිය මිහිරි ගීයක් ගැයුවේ ය. (2) නුඹ සම්මන්ත්‍රණයට සහභාගී වූයෙහි.
(3) විදුහල්පතිතුමිය සභාව ඇමතූහ. (4) මහ සුළඟින් ගස් ඉදිරී වැටුණෝ ය.

**(11)** මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් **නොවන** පදයක් සහිත පිළිතුර තෝරන්න.

(1) තද්ධිත - රන්මුවා, ඉන්දියානු, බුද්ධිමත්, දුබලතා (2) විශේෂණ - කඩිසර, අලුත්, වේගයෙන්, විශාල
(3) ජාති නාම - ගිරා, පක්ෂි, මිනිස්, සිංහ (4) ද්‍රව්‍ය නාම - පොත්, සියුම්, දිය, මැටි

- **අංක (12) සහ (13) ප්‍රශ්නවල දැක්වෙන වාක්‍යවල හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.**

**(12)** ............................... දේවාලයේ කපුරාල ලවා භාරහාර හා යාතිකා කරවා ගනිති.

(1) බැතිමත්තු (2) බැතිමතුන් (3) බැතිමතා (4) බැතිමතකු

**(13)** සාත්තු සප්පායම් කිරීමට ............................... ඇය වෙනුවෙන් නිල කරන ලදහ.

(1) සේවකයකු (2) සේවිකාවක් (3) සේවකයෝ (4) සේවකයින්

**(14)** මුලින් දී ඇති පදවල අර්ථය නිවැරදිව දක්වා ඇති පිළිතුරු යුගලය තෝරන්න.

A. පාදපරිචාරිකාව = චාරිකාවේ යෙදීම B. මහණ ගොයුම්හු = බුදුරජාණන් වහන්සේ

C. අටසාළිස් = අසූ හතරක් D. රුපුනොද = සතුරන්ගේ එඩිය

(1) A සහ B වේ. (2) B සහ C වේ. (3) B සහ D වේ. (4) C සහ D වේ.

**(15)** "මං සදන්නන් ගල කඩන තැන
බිම් කොටන්නන් සරන වැඩ බිම
දූලි තැවරුණු සළු දරා ගෙන
අව්වේ වැස්සේ සිටිති දෙවියෝ" - මෙම පද්‍යයේ මුල් නිර්මාණකරු වන්නේ,

(1) මහගම සේකර ය. (2) රබීන්ද්‍රනාත් තාගෝර් ය.

(3) එස්. මහින්ද හිමි ය. (4) කුමාරතුංග මුනිදාස ය.

**(16)** පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරන්න.

- "හිමියනි, ඔහුට සමාව **<u>දෙනු මැනවි.</u>**"
- "වනන්තරේ වන සපු මල් **<u>පිපීයන්</u>**"
- ඕ තොමෝ මලෙහි සුවඳ **<u>විඳ</u>** ලැබුවා ය සතුටක්"
- ගුරුතුමිය කවියක් ගායනා **<u>කරමින්</u>** වේදිකාවට නැඟුණා ය.

(1) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා (2) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(3) විධි ක්‍රියා, ආශීර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා (4) ආශීර්වාද ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා

**(17)** "මගේ නංගිගෙ පොඩි හිනාව
වගේ ය මේ පිච්ච පොකුර
...............................................
කොයින් ද මේ රෝස මලට" - මෙම කවියෙහි හිස්තැනට ගැළපෙන පද පේළිය තෝරන්න.

(1) වගෙයි නේද මේ ගස් ටික (2) ඇගෙ කම්මුල් දෙකේ පාට

(3) ඇගෙ මුහුණේ රෝස පාට (4) ගල්වා ඉසෙහි තෙල් යහමින්

**(18)** උපමාවක් යෙදී **නොමැති** පිළිතුර තෝරන්න.

(1) "ගිනි පුපුරක් සේ දිස් විය ඇයගේ නෙත් යුගල" (2) "පරෙවි රජන ලෙසින් ඇය පියඹා ගොසින්"

(3) "සුර අඟනක විලසට - වේ ද වන සිදඟන" (4) "පිපී පිපී රේණු නටන වනේ මලක හැප්පිලා"

**(19)** නිවැරදි ප්‍රකාශය සහිත පිළිතුර තෝරන්න.

(1) සුමංගල ශබ්දකෝෂය වස්කඩුවේ ශ්‍රී සුභූති හිමියන්ගේ සම්පාදනයකි.

(2) වේගයෙන් හා වැඩි ප්‍රාණයකින් හඬ හා වායුව පිට කිරීමෙන් මහාප්‍රාණ ශබ්ද උපදී.

(3) "රාත්‍රිය" පද්‍ය පන්තිය තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ නිර්මාණයකි.

(4) "ගියහ." යන ආඛ්‍යාතය ප්‍රථම පුරුෂ, බහු වචන, වර්තමාන කාලයට අයත් ය.

**(20)** "මෙනිරිඳුගෙ දූ ළඳ
උලකුඩය දේවී **සඳ**
සොමි ගුණෙනි පුන් **සඳ**
පවති සිරි **සඳ** සිරින් ඇම **සඳ**" - ඉරි ඇඳි බහ්වර්ථ පදයේ අර්ථ නිවැරදිව අනුපිළිවෙළින් දක්වා ඇත්තේ,

(1) උතුම් / චන්ද්‍රයා / කාන්තාව / කල්හි (2) චන්ද්‍රයා / කාන්තාව / කල්හි / උතුම්

(3) කාන්තාව / කල්හි / උතුම් / චන්ද්‍රයා (4) කල්හි / උතුම් / චන්ද්‍රයා / කාන්තාව

(ලකුණු 02 x 20 = 40යි.)

## II - පත්‍රය

- **(01)** සහ **(02)** ප්‍රශ්න **අනිවාර්ය** වේ. (03), (04), (05), (06), (07) යන ප්‍රශ්නවලින් තුනක් තෝරා ගෙන **ප්‍රශ්න පහකට පමණක්** පිළිතුරු සපයන්න. මෙම කොටසට නියමිත ලකුණු ගණන **60**කි.

**(01)** පන්ති කාමරයේ දී ඇගයීමක් ලෙස ඔබ විසින් සකසන ලද **"පොත් පිංච"** ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i) ඔබ විසින් සකසන ලද පොත් පිංචට යෙදූ නම කුමක් ද ? (ලකුණු 02යි.)

ii) පොත් පිංච සැකසීමේ දී ගුරුතුමාගෙන් / ගුරුතුමියගෙන් ඔබට ලැබුණු උපදෙස් **දෙකක්** ලියන්න. (ලකුණු 04යි.)

iii) පොත් පිංච සැකසීමට අවශ්‍ය තොරතුරු සපයා ගත් මූලාශ්‍ර **දෙකක්** ලියන්න. (ලකුණු 02යි.)

iv) මෙම ඇගයීම සිදු කිරීමේ දී ඔබට මතු වූ ගැටලු **දෙකක්** ලියන්න. (ලකුණු 02යි.)

v) පොත් පිංච නිර්මාණශීලීව ඉදිරිපත් කිරීමට අනුගමනය කළ උපක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි.)

vi) මෙම ඇගයීම සිදු කිරීම මගින් ඔබට ලැබුණු ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 02යි.)

(මුළු ලකුණු 16යි.)

**(02)** පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** තෝරා ගෙන වචන **150කට නො අඩු** රචනයක් ලියන්න.

(i) අලුත් අවුරුදු සිරිත් විරිත්

(ii) නීරෝගී බව උතුම් සැපතකි.

(iii) සොබාදම් පරිසරය සුරකිමු.

(iv) මා දුටු ආගමික පෙරහැරක්

(v) මාර්ග අනතුරු වළක්වා ගනිමු. (ලකුණු 14යි.)

**(03)** "පිරිසිදු ශ්‍රී ලංකාවක්" යන වැඩසටහන පිළිබඳ පාසල් සිසු සිසුවියන් දැනුම්වත් කිරීමට සුදුසු **දැන්වීම් පත්‍රිකාවක්** නිර්මාණය කරන්න. පරිසර සංගමයේ ලේකම් ඔබ යැයි සිතන්න.

**නැතහොත්**

මීගමුව නගර සභා පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගැනීමට අවශ්‍ය **අයදුම් පත්‍රයක්** සකස් කරන්න. මනඃකල්පිත තොරතුරු යොදා ගනිමින් එය සුදුසු පරිදි පුරවන්න.

(ලකුණු 10යි.)

**(04)** පෙළ පොත ඇසුරෙන් අසා ඇති පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i) "මගෙ හුරතල් අක්කාගේ
මාලේ මුතු ඇට වාගේ
මේ වැටෙන්නෙ පිනි බින්දුත්
හදමු එකක් ඒ වාගේ"

- ඉහත කවියේ ඇතුළත් උපමාව සහ උපමේයය වෙන් වෙන් ව ලියා දක්වන්න.

ii) කාවඩි පූජාවේ දී යොදා ගැනෙන කාවඩි වර්ග **දෙකක්** නම් කරන්න.

iii) "වැසි වසිනා අහස අපි" ගීතයේ රචකයා කවුරුන් ද ? එය මුල් වරට ගායනා කරන ලද්දේ කවුරුන් ද ?

iv) "සැබෑ ළෙන්ගතුකම" පාඩමට පාදක වූ කතාවේ රචකයා කවුරුන් ද ?

v) "ඉන්ද්‍රශාල ගුහාවෙහි දී ශක්‍රයන් වැඳ ගෙන හොත් ගමනේ ම මළවුන්ට 'ජීවත් වව'යි වදාළ බස් පමණකින්...."

- මෙම කොටස උපුටා ගත් කතා පුවත කුමක් ද ?

(ලකුණු 02 × 5 = 10යි.)

**(05)** පහත සඳහන් ප්‍රකාශ **කවුරුන්** විසින් **කා හට** කියන ලද දැයි ලියන්න.

i) "එය මා ලද උසස් ම ත්‍යාගය යි."

ii) "අපිට ඕවායේ හයක් හතරක් දැනෙන්නේ නැහැ."

iii) "අද නැවා ම ආයේ නාන්න තියෙන්නේ තව දවස් දෙකකින්."

iv) "මේක කාටත් පොරෝජන වෙන දෙයක් හරි ද?"

v) "පොලිසියෙන් දන්වනවා ඒ ඉන්න තැනට." (ලකුණු 02 × 05 = 10යි.)

**(06)** පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) ශබ්දකෝෂ පරිහරණයෙන් ලද හැකි ප්‍රයෝජන **දෙකක්** ලියන්න.

ii) පහත සඳහන් පද යොදා ගනිමින් අර්ථවත් වාක්‍ය එක බැගින් ලියන්න.

(අ) පැල -　　　　　　(ආ) පැළ -

iii) පහත දැක්වෙන වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

(අ) උපාසිකාවෝ බුදු පුදට යති.

(ආ) තාරකා රාත්‍රී අහසේ බබළයි.

iv) පහත සඳහන් වාක්‍යාංශවලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) ජලයෙහි උපන් -

(ආ) ගලෙහි කෙටූ ලියවිලි -

v) පද දෙකෙහි ම අර්ථයක් නොමැති යුගල පද **එක බැගින්** යොදා වාක්‍ය **දෙකක්** ලියන්න.

(ලකුණු 02 × 05 = 10යි.)

**(07)** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1955 දී ඇරඹුණු චන්ද්‍රිකා තාක්ෂණය පිළිබඳ පර්යේෂකයින්ගේ ප්‍රතිඵලයක් ලෙස 1960 දී 'එකෝ' නම් වූ ප්‍රථම සන්නිවේදන චන්ද්‍රිකාව අභ්‍යවකාශගත වූ අතර අද සමස්ත විශ්වය ඉන් එක ම ගමක් බවට පත් වී තිබේ. ස්ථාවර චන්ද්‍රිකා භ්‍රමණය වන කක්ෂය, 'ක්ලාක් බෙල්ට්' හා 'ක්ලාක් ඕර්බිට්' යනුවෙන් හැඳින්වෙන්නේ, මෙම චන්ද්‍රිකා තාක්ෂණය අනාවරණය කිරීමෙන් ලෝකයට සිදු කරන ලද අනුපමේය මෙහෙය උදෙසා එතුමාට කරන ගරු කිරීමක් වශයෙනි. බ්‍රිතාන්‍ය රජය 1982 වසරේ ආතර් සී. ක්ලාක් මහතා වෙත 'මාකෝනි' සම්මානය සමග ඇමෙරිකානු ඩොලර් පන් දහසක මුදලක් පිරිනැමූ අතර එතුමා විසින් එම මුදල මෙරට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට පිරිනමන ලද්දේ එතෙක් අඩුවක් ව පැවති නව තාක්ෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ය. 1984 පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපනය කරන ලද මෙම ආයතනය, මොරටුව, කටුබැද්ද සරසවිය ඉදිරිපිට පිහිටුවා තිබේ.

i) අභ්‍යවකාශගත වූ ප්‍රථම සන්නිවේදන චන්ද්‍රිකාව කුමක් ද ?

ii) ආතර් සී. ක්ලාක් මහතා වෙත පිරිනැමූ සම්මානය කුමක් ද ?

iii) එතුමා ලද ඩොලර් පන් දහසක මුදල මෙරටට පිරිනැමුවේ කුමක් සඳහා ද ?

iv) මෙහි දැක්වෙන සරසවියේ නම කුමක් ද ?

v) මෙහි සඳහන් විද්‍යාඥයා විසින් සිදු කරන ලද සුවිශේෂී මෙහෙය කුමක් ද ?

(ලකුණු 02 × 05 = 10යි.)